**ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ශ්‍රී ලංකාවේ විස්තීර්ණ ණය පහසුකමෙහි දෙවන සමාලෝචනය පිළිබඳ නිලධාරී මට්ටමේ එකඟතාවයකට එළඹෙයි**

2017 මැයි මස 3 වන දින

| |
|---|
| මෙම ප්‍රකාශනයේ ඇති අදහස් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදලේ) නිලධාරීන්ගේ මතය වන අතර, එමගින් අවශ්‍යයෙන්ම ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ මතය පිළිබිඹු නොකෙරෙයි. මේ දක්වා රැස් කර ගෙන ඇති කරුණු පදනම් කරගෙන කළමනාකාරිත්වයේ අනුමැතියට යටත්ව ජා.මූ.අරමුදලේ නිලධාරීන් වාර්තාවක් පිළියෙළ කරන අතර, එය ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ සාකච්ඡා කිරීමටත්, තීරණ ගැනීම සඳහාත් ඉදිරිපත් කෙරෙයි. |

- නිලධාරී මට්ටමේ එකඟතාවය, බලධාරීන් විසින් ක්‍රියාත්මක කළ යුතු පූර්ව ක්‍රියාමාර්ග සම්පූර්ණ කිරීමට සහ 2017 ජූනි මාසයේ දී පැවැත්වීමට නියමිත ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩල රැස්වීමේ අනුමැතියට යටත් වේ.
- නව දේශීය ආදායම් පනත මගින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය අඛණ්ඩව පවත්වාගෙන යෑමට අවකාශ සලසනු ඇත.
- අවිනිශ්චිත ගෝලීය ආර්ථික වටපිටාවක් තුළ රාජ්‍ය මූල්‍ය සහ විදේශීය අංශයන්හි අවදානම් කළමනාකරණය කර ගැනීම සඳහා ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව පවත්වා ගැනීම වැදගත් වේ.

මාර්තු මාසයේ දී කොළඹ සිදු කළ සංචාරයේ දී බලධාරීන් සමඟ සිදු කළ සාධනීය සාකච්ඡා සහ ඉතා මෑතක දී පැවැත්වුණු ජා.මූ. අරමුදලේ අර්ධ වාර්ෂික සමුළුව අතරතුර පැවති සාකච්ඡාවලින් පසුව ජා.මූ. අරමුදලේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වොෂින්ටන් නුවර දී පහත සඳහන් ප්‍රකාශය නිකුත් කරන ලදී.

"බලධාරීන් විසින් පූර්ව ක්‍රියාමාර්ග සම්පූර්ණ කිරීමට සහ ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ අනුමැතියට යටත්ව, තුන් අවුරුදු ණය පහසුකම තුළින් සහාය ලැබෙන

ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහනෙහි දෙවන සමාලෝචනය පිළිබඳ ශ්‍රී ලංකා බලධාරීන් සමඟ ජා.මූ. අරමුදලේ නිලධාරීන් කණ්ඩායම එකඟතාවයකට එළඹුණි.

"2017 වසරේ ජුනි මාසයේ දී දෙවන සමාලෝචනය අවසාන කිරීමට ශ්‍රී ලංකාව විසින් කළ ඉල්ලීම විධායක මණ්ඩලය විසින් සලකා බලනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, ඒ වන විට පූර්ව ක්‍රියාමාර්ගයක් ලෙස නව දේශීය ආදායම් කෙටුම්පත පාර්ලිමේන්තුවට යොමු කර තිබෙනු ඇතැයි අපේක්ෂා කෙරෙයි. මෙම නව පනත ආදායම් එක්රැස් කිරීම මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව අඛණ්ඩව පවත්වා ගෙන යෑමට අවකාශ සලසනු ඇති අතර, මෙය රජයේ ප්‍රතිසංස්කරණ වැඩසටහනෙහි මූලික අංගයකි.

"2016 වසර අවසානයේ දී ශුද්ධ විදේශීය සංචිත සඳහා වූ ඉලක්කය සපුරාලීමට නොහැකි වීම හේතුවෙන් සිදු වූ පසුබෑම මඟහරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා බලධාරීන් විසින් මෙම වසර තුළ දී සංචිත නැවත ගොඩනැංවීම සඳහා දරන උත්සාහය ජා.මූ. අරමුදලේ නිලධාරී කණ්ඩායමෙහි පැසසුමට ලක් වේ. මෙලෙස විදේශීය සංචිත ගොඩනැංවීම අඛණ්ඩව සිදු කළ යුතු වන අතර එය ශ්‍රී ලංකාවේ විදේශීය අංශයේ පැවති අවදානම අවම කර ගැනීම සඳහා උපකාරී වනු ඇත.

"ශ්‍රී ලංකා බලධාරීන් විශේෂයෙන්ම, රාජ්‍ය මූල්‍ය තත්ත්වයෙහි ඇති වූ වැඩිදියුණු වීම සමඟ ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළෙහි ප්‍රගතියක් අත්පත් කර ගනිමින් සිටී. අවිනිශ්චිත ගෝලීය ආර්ථික වාතාවරණය හමුවේ, රාජ්‍ය මූල්‍ය අංශයේ සහ විදේශීය අංශයේ පවතින අසමතුලිතතා නිරාකරණය කර ගැනීම සඳහා මෙම ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ අඛණ්ඩව පවත්වාගෙන යෑම බෙහෙවින් වැදගත් වනු ඇත."